වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව

යාපනය දිස්ත්‍රික්කය

----------------------

1. මූල්‍ය ප්‍රකාශන

--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 30 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය

---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සභාවට අයත් ලාස් 32 ප්‍රමාණයෙන් යුත් හින්දු සුසාන භූමි ඉඩම අනවසරයෙන් අල්ලා ගැනීම සහ ලාස් 60 ප්‍රමාණයෙන් යුතු රු.3,242,600 කට මිලටගත් සභාවට අයිති වලිනුන්නායි ඉඩමේ අයිතියට අදාළ නඩු පසුගිය වසර 15 තිස්සේ දිස්ත්‍රික් උසාවියේ විසඳීමකින් තොරව පැවති බැව් නිරීක්ෂණය විය. එසේවුවත් මෙම කරුණු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) එකතුව රු.13,775,336 ක්වූ සභාවට අයත් නොවූ දේපළ 12 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ බැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සභාවට අයත් කාඩාප්පුලම් දේපලෙහි රු.4,508,825 ක්වූ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබූ බැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්රකාශනවල ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සභාවට අයත් වාහන 9 ක් වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ගෙන නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල මෝටර් වාහන හා සයිකල් වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 අනුකූල නොවීම්

--------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-------------------------------------------------------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | ------------------------------- | ------------ | --------------------- |
| | | රු. | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත<br>158(1) වගන්තිය | 10,031,741 | දේපළ මත හිඟ තක්සේරු බදු ගෙවීම් පැහැර හැරි පුද්ගලයන්ට සභාවේ ලේකම් විසින් වරෙන්තුවක් නිකුත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුසි<br>මුදල් රෙගුලාසි 571 | 127,500 | පසුගිය වර්ෂය සිට වර්ෂ 07 දක්වා කාලය සඳහා වූ කල්ඉකුත් ටෙන්ඩර් තැන්පතු පිළිබඳව සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| (ඇ) | උතුරු පළාත් මුදල් චක්‍රලේඛය<br>2017 මාර්තු 07 දිනැති අංක පීඑස්/01/2017 චක්‍රලේඛය | | නිලධාරී පස්දෙනෙකුගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.50,399,647 ක් වූ අතර, ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්ත වියදම ඉක්මවූ ආදායම රු.45,367,037 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

----------------------

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

-------------------------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| ------------ | ---------------- | ----------- | ------------- | --------------- | -------------- | ----------- | ----------- | ----------- |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 2,615,000 | 2,535,003 | 2,600,466 | 6,879,629 | 2,725,000 | 3,005,975 | 2,599,792 | 6,899,457 |
| (ii) කුලී | 28,585,000 | | 30,103,144 | | 25,288,600 | | 21,454,260 | |
| (iii)බලපත්‍ර ගාස්තු | 3,248,700 | | 3,442,528 | | 2,826,000 | | 3,450,048 | |
| (iv)වෙනත් ආදායම් | 42,812,000 | | 89,464,080 | 215,634,685 | 43,392,000 | | 63,403,076 | 193,861,477 |
| එකතුව | 772,260,700 | 2,535,003 | 125,610,218 | 222,514,314 | 74,231,600 | 3,005,700 | 90,907,176 | 200,760,934 |

2.2.2 වරිපනම් හා බදු

-------------------

වරිපනම්

---------

එකතුව රු.10,031,740 ක් වූ දේපළ මත හිඟ තක්සේරු බදු අයකර ගැනීම සඳහා පසුගිය වසරේ සිට වසර 54 ක් දක්වා වූ කාලයේදී සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.2.3 කුලී

-----

වෙළඳ අයිතිය මත බදු

-------------------------

මාළු වෙළඳ පොලක් බදු දීම වෙනුවෙන් අයකරගත යුතු එකතුව රු.275,508 ක් වූ හිඟ බදු වෙනුවෙන් නඩුවක් වසර 02 ක් තිස්සේ විසඳී නොමැති බැව් නිරීක්ෂණය විය.

2.2.4 බලපත්‍ර ගාස්තු

-----------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ එකතුව රු.6,000 ක්වූ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අත්හැර දැමූ කාර්යයන්

-------------------------

සමාලෝචිත වර්ෂය තුළදී සිදුකිරීමට සැලසුම් කරන ලද රු.198,200,000 ක් වටිනා ප්‍රාග්ධන වැඩ 50 ක් නිමකිරීමකින් තොරව මුළුමනින්ම අත්හැර දමා තිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. දෛනික කසළ රැස්කිරීම් කැබලිකර ඒවා පස් දමා වසා නොතිබුණි.

ii. මදුරුවන් සහ කීට පැතිරීම වැළැක්වීම සහ දුර්ගන්ධය වැළැක්වීම සඳහා මදුරු තෙල් ඉසීමට කටයුතු කර නොතිබුණි.

iii. ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව වෙන් කිරීම් නොකර ඝන අපද්‍රව්‍ය රැස්කර නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

--------------------------------------

සභාව මානව සම්පත් බඳවා ගැනීම සහ යෙදවීම විධිමත්ව සිදුකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මානව සම්පත් 12 ක් විසින් නිමකළ යුතු වැඩ ප්‍රමාදවී නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පසුගිය වසර 34 පුරාම පන්ඩකරිප්පු ප්‍රාදේශයේ පිහිටි දේපළ සඳහා තක්සේරු කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) සභාවට අයත් සුසාන භූමි 14 ක් සඳහා වූ සංවර්ධන වැඩ සිදුකර තිබුණි. කෙසේවෙතත්, සුසාන භූමි බදු අයකර නොතිබුණි.

3.4 මතභේදයට තුඩුදෙන ස්වභාවයේ ගණුදෙනු

--------------------------------------------------

පළාත් පාලන ව්‍යාපෘතියේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වූ අරමුදලින් රු.40,486,686 ක පිරිවැයක් දරා පුස්තකලයකින් සමන්විත ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකර 2012 අගෝස්තු 15 දින භාරදී තිබුණි. ඉහත සඳහන් කර්මාන්තය සඳහා වූ අවසාන ගෙවීම කිරීමේදී සිදුවූ ප්‍රමාදය නිසා රු.3,401,024 ක්වූ පොලී සහා අරමුදලින් අයකර කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු බැව් නිරීක්ෂණය විය. අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ 2016 අප්‍රේල්06 දිනැති අංක එන්ජී/05/01/පීඑස්/වීඑස්ඩබ්/30/02 ලිපිය පරිදි, එම පොලිය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම උතුරු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් වෙතින් පසුගිය වසර දෙක පුරාම ප්‍රමාදවී ඇති බැව් තවදුරටත් නිරීක්ෂණය විය.

3.5 වත්කම් කළමනාකරණය

----------------------------

3.5.1 වත්කම් භාරදීමට අසමත්වීම

--------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් පාවිච්චි කරමින් තිබූ, පළාත්සභා සහ පළාත්පාලන අමාත්‍යාංශයට අයත් පික්අප් රථයක් සභාවේ කටයුතු කිරීම් කාලය 2013 වර්ෂයේදී අවසන්වීම සමඟ, සභාවේ හිටපු සභාපති විසින් භාරදීමෙන් තොරව රැගෙන ගොස් තිබුණි. කෙසේවෙතත් මේ දක්වාම එකී වාහනය සභාවට භාරදී නොතිබුණි.

(ආ) සභාවට අයත් නොවන ට්‍රැක්ටරයක් පසුගිය වසර 07 ක සිට වසර 16 ක් පුරාම සභාව විසින් භාවිතා කර තිබුණි.

5.3.2 නිෂ්ක්‍රිය වත්කම්

----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පිරන්පත්තු ප්‍රාදේශයේ රු.800,625 ක පිරිවැයකින් ඉදිකළ සති වෙළඳපොළ සංකීර්ණය භාවිතයට ගැනීම සඳහා පසුගිය වසර 02 පුරාම සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) භාවිතයටගත නොහැකි තත්ත්වයේ බවුසර දෙකක් පැවතිණි.

3.5.3 වාර්ෂික සමීක්ෂණ මණ්ඩල

---------------------------------

භෞතිකව නොතිබුණු පුස්තකාල පොත් 182 ක් පිළිබඳව වගකිව යුතු පාර්ශව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4. වගකීම් භාරය සහ යහපාලනය

-----------------------------------

අයවැය පාලනය

--------------------

අයවැයගත ආදායම සහ තත්‍ය ආදායම අතර රු.464,181 සිට රු.13,183,682 හෙවත් සියයට 37 සිට සියයට 21 දක්වාත් අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර රු.85,984 සිට රු.15,859,267 හෙවත් සියයට 16 සිට සියයට 91 දක්වාත් වූ පරාසයක විචලන නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

-----------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය. .

| | පද්ධතිය | අඩුපාඩු |
|---|---|---|
| | --------- | --------- |
| (අ) | ගිණුම්කරණය | පාඩු ලේඛනය, විථී ලාම්පු ලේඛනය, මිණුම් පත්‍රිකා ලේඛනය, ඉඩම් විකුණුම් මත වූ බදු ලේඛනය සහ වාහන ලොග් පොත් නඩත්තු කිරීමට අසමත්වීම. |
| (ආ) | දේපළ | I. සුරක්ෂිතතාවය තහවුරු කිරීමට අසමත්වීම.<br>II. ලේඛන සටහන් තැබීමට අසමත්වීම |